**මාධ්‍ය නිවේදනය**
කොළඹ, 2017 ජූනි 21

Good Food, Good Life

**මෙවර ජනාධිපති කුසලාන අවසාන මහා රග්බි තරගයේදී මයිලෝ වෙතින් ජයඝෝෂා කිරීමට අළුත් මගක් ‘cheer line’**

“16th MAN” වීමට ලොව පුරා සිටින ප්‍රෙක්ෂකයින්ට අවස්ථාවක්

නවෝත්පාදනයක් වූ “16th MAN” ජයඝෝෂා කිරීමේ මාර්ගය හඳුන්වාදීමත් සමඟ, මයිලෝ ජනාධිපති කුසලාන අවසාන මහා රග්බි තරඟය තවත් ආකර්ශනීය කිරීමට කටයුතු කර ඇත. අවසාන මහා තරඟයට සජීවීව සහභාගී විය නොහැකි ප්‍රෙක්ෂකයින් හට, තමා ප්‍රිය කරන කණ්ඩායම - ශාන්ත ජෝසප් හෝ ඉසිපතන - සඳහා වෙන් වූ ඍජු දුරකථන අංකයකට ඇමතුමක් ලබා දී පළමු නාදයෙන් පසු නතර කිරීමෙන් ‘missed call’ එකක් ලබා දිය හැක. මේ මඟින් තරඟයේදී ඔවුන්ගේ කණ්ඩායම දිරි ගැන්වීම සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර මගින් විශේෂිත ජයඝෝෂාවක් ලබා දෙනු ඇත.

ක්‍රීඩාංගනයේ කෝණ හතරෙහි පිහිටා ඇති ශබ්ද විකාශන යන්ත්‍ර වලින් මෙම ජයඝෝෂා විකාශනය කරනු ලැබේ. ‘missed call’ වැඩි වන තරමට ජයඝෝෂාවේ ශබ්දය වැඩි වනු ඇත. ශාන්ත ජෝසප් විද්‍යාලයීය ප්‍රෙක්ෂකයින් සඳහා ලබා දී ඇති දුරකථන අංකය 0 720 760 160 වන අතර ඉසිපතන විද්‍යාලයීය ප්‍රෙක්ෂකයින්ට ලබා දී ඇති දුරකථන අංකය 0 720 760 161 වේ.

"වසර 30කට අධික කාලයක් පුරා මයිලෝ, ශ්‍රී ලංකාවේ පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රයේ හදවතින්ම රැඳී සිට ඇත. අපි දන්නවා මෙම ක්‍රීඩකයින් හට විශාල ශක්තියක් සහ සහයෝගයක් ලබා දෙන රසිකයින්, බොහෝ අවස්ථාවල නොසලකා හැර ඇති බව. ඔවුන් ක්‍රීඩාවෙන් වෙන් කල නොහැකි කොටසක්. සහයෝගයේ ජයඝෝෂා මැදින් ක්‍රීඩකයින් දිරිමත් කරන, මායිම් රේඛාවට ඔබ්බෙන් ඇසෙන ඔල්වරසන් හඬ, ඔවුන් වේ. එම රසිකයින්ට කෘතගුණ දැක්වීමට, ඔවුන් කොහේ සිටියත් ඔවුන්ගේ ප්‍රියතම කණ්ඩායමට සහයෝගය දැක්වීමට සහ එම කණ්ඩායම් වල “16th MAN” වීමට ඔවුන්ට අවස්ථාව සලසා දීමට හැකි වීම ගැන අපි සතුටු වෙනවා.” ලෙස නෙස්ලේ හි පානීය අංශ ප්‍රධානියා විසින් පවසා සිටියා.

2017 ජූනි 24 දින සවස 6.00 සිට මයිලෝ ජනාධිපති කුසලාන අවසාන මහා රග්බි තරඟය පැවැත්වෙන අතරතුර මෙම ජයඝෝෂා කිරීමේ මාර්ග විවෘතව පවතී. තවද #MILO16thMan යන හැෂ් ටැග් අංකය ඔස්සේ Facebook හරහාද මේ ගැන වැඩි විස්තර ලබාගත හැක. එහිදී මෙම ජයඝෝෂා කිරීමේ මාර්ගය මගින්, ලෝකයේ කොහේ සිටියත්, ප්‍රෙක්ෂකයින්ගේ සහය ක්‍රීඩකයින්ට ලබා දෙන මෙන්, රග්බි කණ්ඩායම් සහ අනෙකුත් ප්‍රමුඛ ආධාරකරුවන්, ප්‍රෙක්ෂකයින්ට ආරාධනා කරන වීඩියෝ දර්ශන ද දැකබලා ගත හැක.

නෙස්ලේ ලංකා සමාගමේ ජනප්‍රිය පෝෂණීය පානය වන මයිලෝ, දශක තුනක කාලයක් පුරා මෙරට ලොකු කුඩා සෑම පාසලකම ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් දායකත්වය සපයමින් සිසු දරුවන්ට ශක්තියක් වී ඇත. ක්‍රීඩාවට නවෝත්පාදන ක්‍රම හඳුන්වාදීමෙහි ප්‍රමුඛයෙකු ලෙස කටයුතු කරන මයිලෝ, ඒ මගින් ක්‍රීඩකයින්ට, ඔවුන්ගේ පාසල් වලට, පවුලේ සාමාජිකයින්ට, හිත මිතුරන්ට සහ ප්‍රෙක්ෂකයින්ට, ක්‍රීඩා සමග සම්බන්ධ වීමට වඩා පුළුල් ක්‍රියා මාර්ග සලසා දී තිබෙන අතර ක්‍රීඩා, අරථවත් අත්දැකීම් බවට පත් කරගැනීමට ද අවස්ථාව ලබා දී තිබේ. මෙම සන්නාමය, සාරථකත්වය සඳහා පාරිභෝගිකයන්ගේ අභිප්‍රායට සහාය

දී තිබේ. තවද තම උපරිමය ඉටුකර ගැනීමට ඔවුන්ව පෙළඹවමින්, මයිලෝ, ක්‍රීඩාව සහ යහ පැවැත්ම පිළිබඳ ධනාත්මක සිතුවිලි ප්‍රවර්ධනය කර, පැහැදිලිව පෙන්වා දී තිබේ.